කළුතර අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2018

| | | |
|---|---|---|
| **11 ශ්‍රේණිය** | **ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - II පත්‍රය** | **කාලය පැය දෙකයි** |

**සැලකිය යුතුයි:**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

01. A. මත්ස්‍ය වගාකරුවන් විසින් ජලජ ජීවීන් හට අවශ්‍ය පෝෂණය ලබාදීම සඳහා ගුණාත්මක මත්ස්‍ය ආහාර ලබාදීම වැදගත්වේ.

i. මත්ස්‍ය ආහාරයක් සඳහා යොදා ගන්නා ප්‍රෝටීන් ප්‍රභව කොටස් දෙක සඳහන් කරන්න. ල-2

ii. මත්ස්‍ය ආහාරයකට ලිපිඩ ලබාදෙන ශාක වර්ග දෙකක් ලියන්න. ල-2

iii. මේද ද්‍රව්‍ය විටමින් වර්ග දෙකක් සඳහන් කරන්න. ල-2

iv. මත්ස්‍ය ආහාරයක වර්ණක ප්‍රභව ලෙස යොදා ගන්නා අමු ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. ල-2

v. ජීව ආහාර ලෙස ලබා ගන්නා සත්ව ප්ලවාංගයක් සහ ශාක ප්ලවාංගයක් නම් කරන්න. ල-2

B. ඉහත දක්වා ඇත්තේ ජාඩි දැමීම සඳහා යොදා ගන්නා ගැලීම් සටහනකි.

ජාඩි සෑදීම



i. ඉහත ගැලීම් සටහනේ ඉංග්‍රීසි අක්ෂර වලින් පෙන්නුම් කරන ක්‍රියාවලි සඳහන් කරන්න.
1. A - 2. B- 3. C- 4. D- ල-4
ii. පරිභෝජනයට සුදුසු ජාඩිවල දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. ල-2
iii. ජාඩි සෑදීමට සුදුසු භාජන වර්ග දෙකක් ලියන්න. ල-2
iv. වෙනත් පාරම්පරික මත්ස්‍ය පරිරක්ෂණ ක්‍රම දෙකක් සඳහන් කරන්න. ල-2

02.ශ්‍රී ලංකාවේ ජලජ ජීව සම්පත් කර්මාන්තය සංවර්ධනය කිරීමේදී විවිධ ගැටලු වලට මුහුණ පෑමට සිදුවේ.

i. ජලජ ජීව සම්පත් කර්මාන්තයේදී මුහුණ පාන ගැටලු හතරක් ලියන්න. ල-4
ii. ජලජ ජීව සම්පත් කර්මාන්තයට අයහපත් වන ස්වභාවික විපත් හතරක් ලියන්න. ල-4
iii. මුහුදු ගමන් වලින් ආරක්ෂා වීමට ධීවර ජනතාවට සිදු කරන වත් පිළිවෙත් දෙකක් ලියන්න. ල-2

03.ජලජ ජීව සම්පත් ආර්ථික වටිනාකමක් පෙන්වයි.

i. ජලජ ජීව සම්පත් ප්‍රවර්ධනයට ඇති විභවයන් හතරක් සඳහන් කරන්න. ල-4
ii. ජලජ ජීව සම්පත් කර්මාන්තයේ නව ප්‍රවනතා හතරක් නම් කරන්න. ල-4
iii. ශ්‍රී ලංකාවේ කිවුල් දිය පරිසර වල දක්නට ලැබෙන ජල ප්‍රභව දෙකක් නම් කරන්න. ල-2

04.කරදිය ආශ්‍රිත පර පද්ධති ජෛව විවිධත්වයෙන් ඉහළ පරිසර පද්ධතියකි.

i. කොරල් පර වර්ග දෙක නම් කරන්න. ල-2
ii. කොරල් පර ආශ්‍රිත පරිසර පද්ධතියක ඇති වැදගත් කම් හතරක් සඳහන් කරන්න. ල-4
iii. මුහුදු තෘණ ආශ්‍රිත පරිසරයක ඇති වැදගත්කම් හතරක් ලියන්න. ල-4

05.මත්ස්‍යයකුගේ කායික විද්‍යාත්මක ක්‍රියාවලි ඔවුන්ගේ හැසිරීම් රටා හා බැඳී පවතී.

i. මත්ස්‍යයකුගේ ආහාර මාර්ග පද්ධතිය නම් කළ රූප සටහනක් මගින් දක්වන්න.
(නම්. 2 + රූප. 2) ල-4
ii. ශාක භක්ෂක හා මාංශ භක්ෂක මත්ස්‍යයන්ගේ ආහාර මාර්ගයේ දැකිය හැකි වෙනස් කම් තුනක් සඳහන් කරන්න. ල-3
iii. පහත සඳහන් මත්ස්‍යයන්ට ශ්වසනය කිරීමට උපකාරී වන ව්‍යුහ සඳහන් කරන්න
1.ආදා 2.ලූලා 3.කවයියා. ල-3

06.ශ්‍රී ලංකාව තුල විසිතුරු මත්ස්‍ය වගාව වානිජ මට්ටමෙන් පවතී.

i. ස්වභාවය අනුව විසිතුරු මසුන් වර්ග කර උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න.
(නම්. 3 + උදා. 3) ල-6
ii. අභිජනනය සඳහා තොරා ගන්නා මත්ස්‍යයකුගේ ලක්ෂණ දෙකක් ලියන්න. ල-2
iii. මත්ස්‍ය ටැංකියක ප්‍රශස්තව පවත්වා ගත යුතු රසායනික සාධක දෙකක් ලියන්න. ල-2

07.ඉස්සන් වගාව ආර්ථික ප්‍රතිලාභ ලබා දෙන සාර්ථක කර්මාන්තයකි.

i. ඉස්සෙකුගේ ජීවන චක්‍රය ඇඳ කොටස් නම් කරන්න. (අඳින්. 3 + නම්. 3) ල-6
ii. පොකුණකට දැමීමට සුදුසු අවධියේ ඉස්සෙකුගේ තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න. ල-2
iii. ඉස්සන් වගාවේදී රෝග ඇති කරන රෝග කාරකයන් දෙදෙනකු නම් කරන්න. ල-2